රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ ජනරාල්ගේ

# කාර්ය සාධන වාර්තාව

## 2013 වර්ෂය







# දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා රබර් වගාව හා කර්මාන්තය මෙහෙයවීම

# මෙහෙවර

රබර් වගාව හා කර්මාන්තයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක වර්ධනය උදෙසා නෛතික විධිවිධාන ක්‍රියාත්මක කිරීම, රබර් වගාව සඳහා මූල්‍ය සහනාධාර, කෘෂි යෙදවුම් හා ව්‍යාප්ති සේවා සැපයීම සහ රබර් කර්මාන්තයේ සංවර්ධනය.

# අරමුණු

- ❖ රබර් වගා බිම් වල ඵලදායිතාවය ඉහල නැංවීම
- ❖ රබර් වගා බිම් ප්‍රමාණය වැඩි කිරීම
- ❖ සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වලට රබර් වගාව ව්‍යාප්ත කිරීම මගින් ග්‍රාමීය දරිද්‍රතාවය පහළ දැමීම
- ❖ නිමි භාණ්ඩ නිෂ්පාදනය දිරිගැන්වීම තුලින් රැකියා අවස්ථා වැඩිකිරීම හා විදේශ විනිමය ඉපයීම් ඉහල නැංවීම

# පෙරවදන

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් 2010 වසරේ පවත්වන ලද රබර් ඉඩම් සංගණනයෙන් ලැබුණු තොරතුරු පාදක කරගෙන 2013 වර්ෂයේ ඇස්තමේන්තු ගත මුළු රබර් වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 133668 ක් වේ. එම බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර 85083 ක් කුඩා රබර් වතු අංශයට ද, හෙක්ටයාර 48585 ක් වතු සමාගම් සඳහා ද අයත් වේ. වර්ෂයේ මුළු රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 130421 ක් වූ අතර මෙය පෙර වර්ෂය සමඟ සැසඳීමේ දී 14.2% ක අඩුවීමක් පෙන්නුම් කරයි. මුළු රබර් නිෂ්පාදනයෙන් 48% ක් ෂීට් රබර් වන අතර 29% ක ප්‍රතිශතයක් රබර් කිරි නිෂ්පාදනය හා 16% ක ප්‍රතිශතයක් ක්‍රේප් රබර් නිෂ්පාදනයට හා 7%ක ප්‍රතිශතයක් බ්ලොක් රබර් නිෂ්පාදනය සඳහාද වෙන් වී ඇත. මුළු රබර් නිෂ්පාදනයෙන් 18% අපනයනය කර ඇති අතර 82% දේශීය කර්මාන්තකරුවන් විසින් පරිභෝජනය කර තිබේ. අමු රබර් අපනයනයේ මුළු වටිනාකම රු. මි. 9194.00 කි. මලයාසියාව, යුරෝපීය සංගමය, පාකිස්ථානය හා ඉන්දියාව, ජපානය, ඇමරිකාව ශ්‍රී ලංකාවේ අමු රබර් මිලදී ගන්නා ප්‍රධාන රටවල් වන අතර එම රටවල් මිලදී ගත් රබර් ප්‍රමාණය මුළු අපනයන ප්‍රමාණයෙන් 80% කි. 2013 වර්ෂයේ ෂීට් රබර් කිලෝ ග්‍රෑම් 1 ක සාමාන්‍ය මිල රුපියල් 376.78 ක් වූ අතර එය පෙර වර්ෂයට වඩා 9% ක මිල පහල යාමක් විය.

රජයේ මැදිහත්වීම මත රබර් කර්මාන්තයේ උන්නතිය උදෙසා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගන්නා ලද පියවරයන් රබර් නිෂ්පාදනයේ දියුණුවට බොහෝ දුරට ඉවහල්වී ඇත. 2013 වර්ෂය සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 849.85 ක ප්‍රතිපාදන වෙන්වූ අතර රුපියල් මිලියන 801.10 ක වියදමක් දරා ඇති අතර ප්‍රගතිය 94% ක් විය. රජයේ තවාන් වල වසරේ පැල නිෂ්පාදනය මිලියන 2.23 ක් වූ අතර බෙදා හැරි ප්‍රමාණය පැල මිලියන 1.76 ක් විය.
මේ අනුව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය වැඩිවීම තුලින් 2013 වසර රබර් අංශයේ වාර්ෂික ඉලක්ක සපුරාගත් සුවිශේෂී දියුණුවක් ලද වසරක් විය. රබර් නිෂ්පාදනය ඉහල නැංවීමට වෙන්කල ප්‍රතිපාදන උපරිම ලෙස ආයෝජනය කිරීම, මිනිස් හා භෞතික සම්පත් සංවර්ධනය කිරිම, වැඩි දායකත්වයක් හා ඇප කැපවීම හා සේවක තෘප්තිය යනාදී කරුණු තුලින් ද මෙම වසරේ දී සීඝ්‍ර දියුණුවක් ලබා ඇත.

සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල රබර් වගාව ව්‍යාප්ත කිරීමේ වැඩසටහන යටතේ මොණරාගල, හම්බන්තොට මෙන්ම අම්පාර, අනුරාධපුර, පොළොන්නරුව දිස්ත්‍රික්කයන් වලද, සාමකාමී වාතාවරණයක් තුල උතුරු පළාත් සංවර්ධනය කිරීමේ වැඩසටහනට දායක වෙමින් වවුනියා දිස්ත්‍රික්කයේ වවුනියාව හා නැදුන්කර්නි ප්‍රදේශ වලටද, මුලතිව් දිස්ත්‍රික්කයේ ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේ ද නව රබර් වගාව ආරම්භ කිරීමට 2011 වසරේදී ආරම්භ කරන ලද කටයුතු තවදුරටත් ක්‍රියාත්මක කිරීම 2013 වසරේදී ද සිදු කරන ලදී.

දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන යටතේද රබර් වගාවේ සංවර්ධනය උදෙසා සාම්ප්‍රදායිකව රබර් වගා කරන ප්‍රදේශවල සහ සාම්ප්‍රදායික නොවන ප්‍රදේශ වන අම්පාර, මොණරාගල, බදුල්ල, හම්බන්තොට, වවුනියාව යන දිස්ත්‍රික්ක ඇතුළු රබර් වගා කරන සම්ප්‍රදායික ප්‍රදේශ වල පාළු සිටුවීම සඳහා රබර් පැල 80713 ක් සපයන ලද අතර අතුරු භෝග වගාව සඳහා කෙසෙල් පැල 21512 ක් හා අන්නාසි පැල 65887 ක්ද පැෂන් පැල 1271 ක්ද සපයන ලදී.

ඒ සඳහා විවිධාකාරයෙන් සහාය ලබාදුන් සැමට මාගේ ස්තුතිය පුද කරමි.

ආර්. බී. ප්‍රේමදාස
අධ්‍යක්ෂ ජනරාල්
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

# පටුන


1. හැඳින්වීම 1
 1.1. ඓතිහාසික පසුබිම 1
 1.2. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල ප්‍රධාන හා වැදගත් නෛතික මූලාශ්‍ර 2-3
 1.3. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව 3-4
 1.4. දෙපාර්තමේන්තු ආයතනික ව්‍යුහය 5
 1.5. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු 6

2. කාර්ය සාධන ප්‍රගතිය - 2013 වසර 7
 2.1. රබර් වගා සහනාධාර වැඩසටහන 7
 2.2. වැහි ආවරණ යෙදීමේ වැඩසටහන 8
 2.3. අතුරු භෝග වැඩසටහන 8
 2.4. පුහුණු වැඩසටහන් 9
 2.5. සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගා වැඩසටහන 9
 2.6. දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන 10-11

3. ස්වභාවික රබර් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු 2013 12
 3.1. රබර් වගා බිම් ප්‍රමාණය 12
 3.2. නිෂ්පාදනය හා නිෂ්පාදන වියදම 13-14
 3.3. දේශීය රබර් පරිභෝජනය 14
 3.4. අමු ද්‍රව්‍යයක් ලෙස ස්වාභාවික රබර් අපනයනය 15-16
 3.5. රබර් මිල 17
 3.6. රබර් වෙළඳුන් 18
 3.7. රබර් නැවත වගා / අළුත් වගා සහනාධාර ක්‍රමය 18-19
 3.8. "මහින්ද චින්තනය" ඉදිරි දැක්ම හා රජයේ මධ්‍යකාලීන ආර්ථික සැලැස්ම ක්‍රියාත්මක කිරීම හා නව වගාවද ඇතුලත්ව රබර් වගා කිරීමේ ප්‍රගතිය 19-24
 3.9. කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන 25
 3.10. රබර් පැළ තවාන් සහ පැල සැපයීම් 25-28
 3.11. අතුරු භෝග වගාව 28-29
 3.12. වැහි ආවරණ භාවිතය ප්‍රචලිත කිරීම 29
 3.13. තේ, රබර් සහ පොල් ඉඩම් කැබලි කිරීම පාලනය කිරීමේ මණ්ඩලයේ කටයුතු 30
 3.14. අන්තර් ජාතික කටයුතු 30
 3.15. නෛතික කටයුතු 31
 3.16. සහනාධාර ගෙවීම් 32

| | | |
|---|---|---|
| 3.17. | විශේෂ සංවර්ධන වැඩසටහන් | 32-34 |
| 3.18. | ඒකාබද්ධ අරමුදල | 35 |
| 3.19. | සෙස් බදු පිළිබඳ කටයුතු | 36-37 |
| 3.20. | නැවත වගා කිරීමේ උපදේශක මණ්ඩලය | 37 |
| 3.21. | අභ්‍යන්තර විගණන කටයුතු | 38 |
| 4. | ප්‍රාදේශීය කාර්යාල ප්‍රගතිය | 39 |
| 4.1. | රබර් නව වගා ප්‍රගතිය | 39 |
| 4.2. | රබර් නැවත වගා ප්‍රගතිය | 39 |
| 4.3. | අතුරුභෝග වගා ප්‍රගතිය | 40 |
| 4.4. | වැහි ආවරණ යෙදීම | 40 |
| 4.5. | කිරි කැපුම් ශිල්පී පුහුණු වැඩසටහන | 41 |
| 4.6. | කිරි කැපුම් ශිල්පී වෘත්තීය පුහුණු වැඩසටහන | 41 |
| 4.7. | බද්ධකරුවන් පුහුණු වැඩසටහන | 42 |
| 5. | අනෙකුත් ආයතනවල සේවාවන් ඉටුකිරීම | 43 |

# 1. හැඳින්වීම

දශක ගණනාවක සිට ශ්‍රී ලංකාවට විදේශ විනිමය ලබා දෙන ප්‍රධාන ආර්ථික වැවිලි භෝගයක් ලෙසට රබර් වගාව මෙරට ආර්ථිකයට ශක්තිමත් දායකත්වයක් ලබා දී ඇත. ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක දහ හතරක රබර් වගාව ව්‍යාප්ත වී ඇති අතර මේ වන විට මුලතිව්, වවුනියාව, පොළොන්නරුව හා අනුරාධපුර යන දිස්ත්‍රික්ක වලටද රබර් වගාව හඳුන්වා දී ඇත.

## 1.1. ඓතිහාසික පසුබිම

රබර් ශාකය හෙවියා බ්‍රසියලියන්සිස් *(Havea brasialiensis)* යන උද්භිද විද්‍යාත්මක නාමයෙන් හඳුන්වනු ලැබේ. බ්‍රසීලයේ වැසි වනාන්තර වල ස්වාභාවිකව වැඩුනු මෙම ශාකයෙන් ලබා ගන්නා රබර් කිරි මේ වන විට මුළු මහත් ලෝකයේම නිෂ්පාදන රාශියකට යොදා ගන්නා ස්වාභාවික අමු ද්‍රව්‍යක් බවට පත්ව ඇත.

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ එනම් 1876 වර්ෂයේ "හෙන්රි වික්හෙම්" නැමැති ඉංග්‍රිසි ජාතිකයා මුල්ම රබර් පැලය ගම්පහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානයේ රෝපනය කරමින් ශ්‍රී ලංකාවට රබර් ගස හඳුන්වා දෙන ලදී. ඉන් වසර 07 කින් පසු ඇරඹුණු රබර් වගාව දකුණු ආසියාව පුරා ව්‍යාප්ත වී රබර් නිෂ්පාදනය, සීඝ්‍රයෙන් ඉහළ ගියේය. ඊට ප්‍රතිලෝමව රබර් මිල පහළ යාම නිසාම මිල ස්ථාවර කිරීමේ අරමුණින් බ්‍රිතාන්‍යයන් විසින් 1922 දී "ස්ටීවන්සන් පටිපාටිය" හඳුන්වා දුනි. නිෂ්පාදන පංගු ක්‍රමයක් හා අළුතින් රබර් වැවීම සීමා කිරීම් සහිතවූ එම පටිපාටියට රබර් වගා කරුවන්ගෙන්ම ඇතිවූ විරෝධය නිසා 1928 දී අත්හිටුවීය. එසැනින්ම නැවත රබර් සැපයුම වැඩිවී මිල පහළ යාමෙන් පසු 1934 දී රබර් කර්මාන්තයට සම්බන්ධිත සියලු රටවල්වල එකඟතාවයෙන් " International Rubber Regulation Agreement " නැමති ගිවිසුම අත්සන් කෙරිණි. ස්ටීවන්සන් පටිපාටියට සමානවූ කොන්දේසි වලින් සමන්විත එම ගිවිසුමේ වගන්ති ක්‍රියාත්මක කිරීම සඳහා රබර් වවන රටවල රබර් පාලනය සඳහා රාජ්‍ය ආයතන බිහි කරන ලදී. ඒ අනුව " 1934 දී අංක 06 දරණ ආඥා පනත " මගින් රබර් පාලන දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. එම දෙපාර්තමේන්තුවේ මුල්ම රබර් පාලකවරයා වූයේ පී. සරවනමුත්තු මැතිතුමාය.

රබර් කර්මාන්තයේ උන්නතිය උදෙසා "1953 අංක 36 දරණ රබර් නැවත වගා සහනාධාර පනත" සම්මත කර ගන්නා ලදී. රබර් නැවත වගාවට ඉඩ සැලසෙන අයුරින් "1934 අංක 06 දරණ රබර් පාලන ආඥා පනත" ප්‍රතිශෝධනය කරමින් "1956 අංක 11 දරණ රබර් පාලන පනත" සම්මත කරගත් අතර එම පනත හා "1953 අංක 36 දරණ රබර් නැවත වගා සහනාධාර පනත" ට අදාල රාජකාරි රබර් පාලන දෙපාර්තමේන්තුව විසින් කටයුතු මෙහෙයවන ලදි.

රබර් පාලන දෙපාර්තමේන්තුවේ කටයුතු තවදුරටත් පුළුල් කරමින් 1994 වසරේදී එතෙක් පැවති රබර් පාලන දෙපාර්තමේන්තුව අහෝසි කර අමාත්‍ය මණ්ඩල තීරණයක් පරිදි රබර් සංවර්ධන

දෙපාර්තමේන්තුව පිහිටුවන ලදි. මේ අනුව එතෙක් පැවති රාජකාරි වලට අමතරව රබර් වගා ක්ෂේත්‍රයේ සංවර්ධනයට ඉවහල් වන ව්‍යාප්ති සේවා, පැළ නිෂ්පාදනය හා පොහොර බෙදීම වැනි වඩාත් පුළුල් පරාසයක විහිදුනු සේවාවක් සැපයීමට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට හැකි වී ඇත.

තවද මෙම දෙපාර්තමේන්තුවට රබර් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික උපදෙස් ලබා දෙමින් ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයත්, කුඩා ඉඩම් හිමියන්ට අලෙවි හා ව්‍යාප්ති සේවා ලබා දෙමින් තුරුසවිය අරමුදලත් දායකත්වය ලබා දෙනු ලැබේ.

## 1.2. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල ප්‍රධාන හා වැදගත් නෛතික මූලාශ්‍ර

### 1.2.1. 1953 අංක 36 දරණ රබර් නැවත වගා සහනාධාර පනත;

මේ පනත යටතේ රබර් නැවත වගා කිරීම, රබර් නව වගාව, අතුරු භෝග වගාව, කර්මාන්ත ශාලා නවීකරණය හා ක්‍රම පාලනය යන කටයුතු ක්‍රියාත්මක වේ. තවද මෙම පනතේ 7 වගන්තිය යටතේ සෙස් බද්ද පනවා ඇත.

1953 අංක 36 දරණ රබර් නැවත වගා අරමුදල් පනතේ 7 වන වගන්තිය අනුව අපනයන බදු අය කිරීමට නීතිමය ප්‍රතිපාදන සැලසී තිබිණ. මේ අනුව පිටරට යවනු ලැබූ සෑම රබර් රාත්තලක් සඳහාම ශත 10 ක මුදලක් අපනයන බදු ලෙස අය කර ගෙන ඇත.

### 1.2.2. 1956 අංක 11 දරණ රබර් පාලන පනත

රබර් පාලන පනතේ විධි විධාන යටතේ මෙරට පවත්නා සියලුම කුඩා රබර් ඉඩම් හා රබර් වතුවල වගාව, අයිතිකරුවන්, බිම් ප්‍රමාණ ආදිය සටහන් වන ලේඛනයක් පවත්වාගන යෑම රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යවස්ථාපිත කාර්යයකි. රබර් පාලන පනත යටතේ රබර් වගාව පවතින අක්කර 10 ට වැඩි ( හෙක්ටයාර 4.04 ට වැඩි ) රබර් වගාවක් "වත්තක් " ලෙසත්, අක්කර 10 ට අඩු (හෙක්ටයාර 4.04 ට අඩු) රබර් වගාවක් "කුඩා ඉඩමක්" ලෙසත් අර්ථකථනය කර ඇත.

### 1.2.3. 2006 අංක 20 දරණ රබර් නැවත වගා කිරීමේ සහනාධාර ( සංශෝධිත ) පනත

2006 අංක 20 දරණ රබර් නැවත වගා කිරීමේ සහනාධාර (සංශෝධිත) පනතට අනුව , දේශීයව පරිභෝජනයට ගන්නා අමු ස්වභාවික රබර් හා කෘත්‍රිම රබර් මත සෙස් බදු අය කිරීමට ප්‍රතිපාදන සලසා ඇත.

2007 අංක 01 දරණ සෙස් බදු නියෝග ක්‍රියාත්මක වීමට පෙර සෙස් බදු අය කරනු ලැබුවේ ආනයනය හා අපනයනය කරනු ලැබූ ස්වභාවික අමු රබර් හා රබර් ආශ්‍රිත භාණ්ඩ මතය.

2007 අංක 01 දරණ ස්වභාවික රබර් සඳහා වූ සෙස් බදු නියෝග ඇතුලත් 2007 අගෝස්තු 30 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1518/18 දරණ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව අපනයනය කිරීම සඳහා හෝ දේශීය පරිභෝජනය පිණිස නිෂ්පාදනය කරන ස්වභාවික රබර් ආශ්‍රිත නිෂ්පාදන සඳහා අවශ්‍ය අමු රබර් මත කිලෝ ග්‍රෑමයකට රු 4 ක සෙස් බද්දක් අය කිරීමට මෙමගින් ප්‍රතිපාදන සලසා දී ඇත.

මෙහිදී සෘජුවම මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉහත සෙස් බදු මුදල අයකර ගැනීමට බලතල හිමිවී ඇත.

## 1.3. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් වන මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය කොළඹ 02, වෝක්ෂෝල් පටුමග, අංක 55/75 දරණ ස්ථානයේ පිහිටුවා ඇත. ප්‍රධාන කාර්යාලය විසින් පරිපාලන, මෙහෙයුම්, සෙස් බදු එක් රැස් කිරීම හා අනෙකුත් ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු සිදුකරයි. සහනාධාර ගෙවීම, පැල නිෂ්පාදනය කර බෙදා හැරීම, පොහොර බෙදා හැරීම හා උපදේශන සේවා වැනි රබර් වගාවේ සංවර්ධනය සඳහා ඉටු කරන සේවාවන් ජනතාව වෙත වඩාත් කාර්යක්ෂමව ලබා දීමේ අරමුණින් දෙපාර්තමේන්තුවේ කටයුතු විමධ්‍යගත කර ඇති අතර ඒ අනුව ප්‍රාදේශීය කාර්යාල 5ක් පිහිටුවා ඇත.

1. කෑගල්ල ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය

   (කෑගල්ල, කුරුණෑගල, මහනුවර, මාතලේ හා ගම්පහ දිස්ත්‍රික්ක සඳහා)

2. කළුතර ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය

   (කළුතර දිස්ත්‍රික්කය සඳහා)

3. රත්නපුර ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය

   (රත්නපුර හා කොළඹ දිස්ත්‍රික්ක සඳහා)

4. ගාල්ල ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය

   (ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක සඳහා)

5. මොණරාගල ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ කාර්යාලය

   (මොණරාගල, බදුල්ල හා අම්පාර දිස්ත්‍රික්ක සඳහා)

තවද රබර් වගාව සඳහා ගුණාත්මක බද්ධ රබර් පැල නිෂ්පාදනය සඳහා රජයේ පැල තවාන් 07ක් ස්ථාපනය කර ඇත.

1. මීරිගම (ගම්පහ දිස්ත්‍රික්කය)
2. වැලිකඩමුල්ල (ගම්පහ දිස්ත්‍රික්කය)
3. ඇගල් ඔය (කළුතර දිස්ත්‍රික්කය)
4. ගුරුගොඩ (කළුතර දිස්ත්‍රික්කය)
5. කරපිංච (රත්නපුර දිස්ත්‍රික්කය)
6. කුඹුක්කන (මොණරාගල දිස්ත්‍රික්කය)
7. මිද්දෙණිය (හම්බන්තොට දිස්ත්‍රික්කය)



රබර් පැල තවාන




ජල විසුරුම් පද්ධතියක් සහිත පැල තවාන



රබර් පැල තවාන

## 1.4. දෙපාර්තමේන්තු ආයතනික ව්‍යුහය



## 1.5. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු

| අනු අංකය | තනතුර | අනුමත කාර්යය මණ්ඩලය | දැනට සිටින කාර්යය මණ්ඩලය |
|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල්-ශ්‍රී ලං.ප.සේ | 1 | 1 |
| 02 | අධ්‍යක්ෂ- ශ්‍රී ලං.ප.සේ | 2 | 2 |
| 03 | ප්‍රධාන ගණකාධිකාරි ශ්‍රී ලං.ග.සේ | 1 | 1 |
| 04 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ශ්‍රී ලං.ප.සේ , සහකාර අධ්‍යක්ෂ -ශ්‍රී ලං.ප.සේ | 16 | 10 |
| 05 | සහකාර අධ්‍යක්ෂ -ශ්‍රී ලං.ක්‍රි.සේ | 1 | 1 |
| 06 | ගණකාධිකාරි- ශ්‍රී ලං.ග.සේ | 6 | 2 |
| 07 | සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ | 2 | 1 |
| 08 | අභ්‍යන්තර විගණක | 1 | 1 |
| 09 | පරිපාලන නිලධාරි | 4 | 3 |
| 10 | ප්‍රචාරක නිලධාරි | 1 | 1 |
| 11 | අයවැය සහකාර | 1 | 1 |
| 12 | සංවර්ධන නිළධාරි/උපාධිධාරී සහකාර | 27 | 26 |
| 13 | තවාන් කළමණාකරු | 7 | 7 |
| 14 | රබර් සංවර්ධන නිලධාරි : විශේෂ (අධිශ්‍රේණි) | 12 | - |
| 15 | ගොඩනැගිලි නඩත්තු නිලධාරි | 1 | - |
| 16 | රාජ්‍ය කළමණාකරණ සහකාර | 139 | 110 |
| 17 | තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර | 5 | 2 |
| 18 | ලිපිකරු | 17 | 15 |
| 19 | විගණක සහායක | 2 | 1 |
| 20 | රබර් සංවර්ධන නිලධාරි | 182 | 107 |
| 21 | කාර්යාල සේවක සේවය | 28 | 23 |
| 22 | රියදුරු | 36 | 31 |
| 23 | ලොරි සහායක | 8 | 8 |
| 24 | මුරකරු | 3 | 1 |

**කාර්ය මණ්ඩලය සංඛ්‍යා සටහන**

# 2. කාර්ය සාධන ප්‍රගතිය  - 2013 වසර

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2013 වර්ෂයේ කාර්ය සාධනය පිළිබඳව සැලකීමේදී ඉහළ කාර්ය සාධනයක් තුලින් රබර් අංශයේ වාර්ෂික ඉලක්ක සපුරාගත් සුවිශේෂී වසරක් ලෙස සැලකිය හැකිය. එහිදී කාර්ය සාධනය වැඩි කර ගැනීම පිණිස දායක වූ විශේෂයෙන් කැපී පෙනෙන වැඩසටහන් ලෙස

- රබර් වගා සහනාධාර වැඩසටහන
- වැහි ආවරණ යෙදීමේ වැඩසටහන
- අතුරුභෝග වැඩසටහන
- පුහුණු වැඩසටහන්
- දිවි නැගුම ජාතික සංවර්ධන වැඩසටහන යන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

## 2.1. රබර් වගා සහනාධාර වැඩසටහන

රබර් නව වගා වැඩසටහන යටතේ හෙක් 6615 ක ඉලක්කයක් පැවති අතර ඉන් හෙක් 2717.87 ක්ද, මොණරාගල දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 5000 ක් රබර් වගා කිරීමේ විශේෂ වැඩසටහන (IFAD) විදේශාධාර ව්‍යාපෘතිය මෙම වර්ෂයේද ක්‍රියාත්මක කරන ලද අතර ඒ මඟින් හෙක් 262 ක් වවන ලදී. රබර් නව වගාව සඳහා සහනාධාර වශයෙන් රු. මි. 167.73 වියදම් කරන ලදී.

රබර් නැවත වගා වැඩසටහන යටතේ කුඩා වතු සඳහා හෙක් 1961 ඉලක්කයක් පැවති අතර හෙක්ටයාර 1710.52 ක් වගා කරන ලදී. වැවිලි සමාගම් යටතේ හෙක් 1587 ඉලක්කයක් පැවති අතර හෙක් 1007 ක්ද වගා කරන ලදී. ඒ අනුව රබර් නැවත වගාව යටතේ වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙක් 2717.52 කි. රබර් නැවත වගා වැඩසටහන සඳහා සහනාධාර වශයෙන් රු. මි. 268.76 ක් වියදම් කරන ලදී.



වගා සහනාධාර ලබන සාර්ථක රබර් වගාවක්

## 2.2. වැහි ආවරණ යෙදීමේ වැඩසටහන

වැහි ආවරණ යෙදීමේ වැඩසටහන යටතේ කුඩා වතු සඳහා හෙක් 1000 ක ඉලක්කයක් පැවති අතර එයින් හෙක් 517.01 ක් සඳහා වැහි ආවරණ යොදන ලදී. කුඩා වතු සඳහා සහනාධාර වශයෙන් රු. මි. 7.73 ද වැවිලි සමාගම් සඳහා හෙක් 3000 ක ඉලක්කයක් පැවති අතර ඒ සඳහා ඇති දැඩි උනන්දුව මත හෙක් 2708.21 ක් සඳහා වැහි ආවරණ යෙදීමට සහනාධාර වශයෙන් රු. මි. 47.95 ක මුදලක් වැය කරන ලදී.



වැහි ආවරණ යොදන ලද රබර් ඉඩමක්

## 2.3. අතුරු භෝග වැඩසටහන

අපරිණත රබර් වගාව සමඟ රබර් වගා කරුවන්ට අතිරේක ආදායමක් ලබා ගැනීම සඳහා අතුරු භෝග වගා කිරීමේ වැඩසටහන යටතේ හෙක් 517 ක ඉලක්කයක් පැවති අතර එයින් හෙක් 372.89ක් වගා කරන ලදී. අතුරුභෝග වැඩසටහන සඳහා සහනාධාර වශයෙන් රු. මි. 1.08 ක මුදලක් වියදම් කරන ලදී.



රබර් සමග අතුරුභෝග වගා කල ඉඩමක්

## 2.4. පුහුණු වැඩසටහන්

පුහුණු වැඩසටහන් වශයෙන් කිරි කැපුම් ශිල්පී පුහුණු වැඩසටහන සාමාන්‍ය, වෘත්තීය කිරිකැපුම් ශිල්පී පුහුණු වැඩසටහන හා බද්ධ කරුවන් පුහුණු කිරීම පවත්වන ලදී. කිරි කැපුම් ශිල්පීන් පුහුණු වැඩසටහන යටතේ  සාමාන්‍ය කිරි කැපුම් ශිල්පීන් සඳහා ඉලක්කගත පුද්ගලයින් සංඛ්‍යාව 2460 වූ අතර එයින් 2589 දෙනෙකු පුහුණුව අවසන් කරන ලදී. ස්වේච්ඡාවෙන් කිරිකැපුම් ශිල්පී පුහුණු වැඩසටහන්වලට පුද්ගලයින් සහභාගි වීම වැනි හේතු නිසා ඉලක්කයන් ඉක්මවා ප්‍රගතිය වාර්තා වීම මෙම වසරේදී සිදුවූ කැපී පෙනෙන සිදුවීමකි. කිරිකැපුම් ශිල්පී සාමාන්‍ය වැඩසටහන සඳහා රු.මි. 2.00 ක් වියදම් කරන ලදී. වෘත්තීය කිරි කැපුම් ශිල්පීන් සඳහා ඉලක්කගත පුද්ගලයින් සංඛ්‍යාව 300 වූ අතර මෙම වර්ෂයේදී 303 දෙනෙකු මේ සඳහාද පුහුණු කරවන ලදී. වෘත්තීය කිරිකැපුම් ශිල්පී පුහුණු වැඩසටහන සඳහා රු.මි. 3.02 ක් වියදම් කරන ලදී. මෙහිදීද ඉලක්කය ඉක්මවා ප්‍රගතිය වාර්තා කිරීම මෙම වසරේදී කැපී පෙනෙන ලක්ෂණයකි. බද්ධකරුවන් පුහුණු කිරීම සඳහා ඉලක්කගත පුද්ගලයින් සංඛ්‍යාව 240 වූ අතර එයින් 230 දෙනෙකු පුහුණු කරවන ලදී. බද්ධකරුවන් පුහුණු වැඩසටහන සඳහා රු. මි. 0.23 ක් වියදම් කරන ලදී.



කිරිකැපුම් ශිල්පී පුහුණු වැඩසටහනක්


## 2.5. සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගා වැඩසටහන

සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල රබර් වගාව ව්‍යාප්ත කිරීමේ වැඩසටහන යටතේ 2013 වර්ෂයේදී මොණරාගල හෙක් 558 ක්ද අම්පාර හෙක් 402.93 ක්ද, බදුල්ල හෙක් 129.63 ක්ද, වවුනියාව හෙක් 36.8 ක්ද අනුරාධපුර හෙක් 3.6 ක්ද, පොළොන්නරුව හෙක් 3.03 ක්ද හම්බන්තොට හෙක් 38.65 ක්ද වශයෙන් සම්ප්‍රදායික නොවන ප්‍රදේශවල මෙම වසරේදී වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙක් 1172.64 වේ.



සම්ප්‍රදායික නොවන ප්‍රදේශයක ඇති රබර් ඉඩමක්

## 2.6. දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන



**2.6.1.** මෙම වැඩසටහන යටතේ පාළු සිටුවීම සඳහා රබර් පැළ 100,000 ඉලක්කයක් පැවති අතර පැල 80713 ක් සාම්ප්‍රදායික රබර් වගා කරන ප්‍රදේශවල සහ සාම්ප්‍රදායික නොවන ප්‍රදේශ වන වවුනියාව, අම්පාර, බදුල්ල, මොණරාගල, හම්බන්තොට යන දිස්ත්‍රික්කවලට බෙදා දෙන ලදී. ඒ සඳහා මෙම වර්ෂයේදී රු. මි. 5.61 ක මුදලක් වැය කරන ලදී.



රබර් පැල බෙදා දීම

**2.6.2.** අපරිණත රබර් වගා බිම් වල අතුරුභෝග ලෙස වගා කිරීමට කෙසෙල් පැල, අන්නාසි පැල හා පැෂන් පැල නොමිලේ ලබා දෙන ලද ලදී. මෙහිදී කෙසෙල් පැල 21512, අන්නාසි පැල 65887ක් හා පැෂන් පැල 1271ක් වශයෙන් එකතුව පැල 88670 ක් බෙදා දෙන ලදී. ඒ සඳහා වැය කල මුදල රු. මි. 1.75 කි.

**2.6.3.** කිරි කැපුම් ශිල්පී පුහුණුව වැඩසටහන් වලට සහභාගි වූවන් හට 50% සහනාධාර මත කිරි පිහි ලබාදීමේ වැඩසටහනෙහි මෙම වසරේදී පුහුණුව සඳහා ඉලක්කගත පුද්ගලයින් සංඛ්‍යාව 3020 ක් වූ අතර පුහුණුව අවසන් කළ පුද්ගලයින් 2799 දෙනෙකුට කිරි පිහි බෙදා දෙන ලදී. ඒ සඳහා වැය කල මුදල රු. මි. 0.81 කි.



දිවිනැගුම වැඩසටහන යටතේ කිරිපිහි බෙදාදීම

**2.6.4.** දිවිනැගුම වැඩසටහන යටතේ 2013 වසරේ රජයේ රබර් පැල තවාන් සංවර්ධනය කිරීමේ වැඩසටහන ප්‍රථම වතාවට ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ දිස්ත්‍රික්ක පහක ඇති තවාන් 7 හි හඳුනාගත් සංවර්ධන කටයුතු සාර්ථකව නිම කරන ලදී. මේ සඳහා රු.මි 2.82ක මුදලක් වැය කරන ලදී.

# 3. ස්වභාවික රබර් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු - 2013 වසර

## 3.1. රබර් වගා බිම් ප්‍රමාණය

පසුගිය වසර කිහිපයේ රබර් වගා බිම් ප්‍රමාණයේ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කෙරේ. 2013 වර්ෂයේ දිවයිනෙහි ඇස්තමේන්තු ගත මුළු රබර් බිම් ප්‍රමාණය 2010 වර්ෂයේ පවත්වන ලද රබර් ඉඩම් සංගණනයේ ප්‍රතිඵල පදනම් කොට ගණනය කර ඇත.

**රබර් වගා බිම් ප්‍රමාණය- 2013 වර්ෂය**

| | පෞද්ගලික අංශය (හෙක්ටයාර් 20 ට අඩු ඉඩම්) හෙක්. | ප්‍රාදේශිය වැවිලි සමාගම් (හෙක්ටයාර් 20 ට වැඩි ඉඩම්) හෙක්. | එකතුව හෙක්. |
|---|---|---|---|
| 2010 වර්ෂයේ රබර් ඉඩම් සංගණනයෙන් වාර්තා වු බිම් ප්‍රමාණය | 79395 | 46250 | 125645 |
| 2011 වර්ෂයේ ඇස්තමේන්තු ගත බිම් ප්‍රමාණය | 80018 | 48516 | 128534 |
| 2012 වර්ෂයේ ඇස්තමේන්තු ගත බිම් ප්‍රමාණය | 82170 | 48610 | 130780 |
| 2013 වර්ෂයේ ඇස්තමේන්තු ගත බිම් ප්‍රමාණය | 85083 | 48585 | 133668 |

**සංඛ්‍යා සටහන ii**

රබර් වගාව පවතින බිම් ප්‍රමාණයෙන් 63.65% ක් කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ඉඩම් කට්ටි වශයෙන්ද, ඉතිරි ප්‍රමාණය වැවිලි සමාගම් වතු වශයෙන්ද පවතී. මෙම බිම් ප්‍රමාණයෙන් අපරිනත බිම් ප්‍රමාණය හෙක්ටයාර් 29098 ක්ද, කිරි කපන පරිනත බිම් ප්‍රමාණය හෙක්ටයාර් 104570 ක්ද ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එම වගාවෙන් ලත් මුළු නිෂ්පාදන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 130421 ක් වේ. 2013 වර්ෂයේ රබර් හෙක්ටයාරයක සාමාන්‍ය වාර්ෂික අස්වැන්න වියලි රබර් කිලෝ ග්‍රෑම් 1247 ක් ලෙසද ඇස්තමේන්තු කර ඇත.

## 3.2. නිෂ්පාදනය හා නිෂ්පාදන වියදම

### 3.2.1. නිෂ්පාදනය

2013 වර්ෂයේ මුළු රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 130421 කි. එය පෙර වර්ෂයේ මුළු නිෂ්පාදනය වන මෙට්‍රික් ටොන් 152049 ක ප්‍රමාණය හා සසඳන කල 14.2% ක අඩුවීමක් පෙන්නුම් කරයි. මෙලෙස නිෂ්පාදනය අඩු වීමට බල පෑ ප්‍රධාන හේතුවක් වන්නේ 2012 වර්ෂයට සාපේක්ෂව රබර් මිල පහල යාම වේ.

**2013 වර්ෂයේ මුළු රබර් නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)**

| වර්ෂය | ෂීට් රබර් | ස්ක්‍රැප් ක්‍රේප් | සෝල් ක්‍රේප් | ලේටෙක්ස් ක්‍රේප් | බ්ලොක් රබර් T.S.R | ලේටෙක්ස් සහ වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2012 | 59242 | 1280 | 1902 | 36550 | 8672 | 44403 | 152049 |
| 2013 | 62800 | 2379 | 2440 | 15373 | 9566 | 37863 | 130421 |

**සංඛ්‍යා සටහන iii**





**ක්‍රේප් රබර් නිෂ්පාදනය**

### 3.2.2. නිෂ්පාදන වියදම

වියලි රබර් කිලෝ ග්‍රෑමයක් නිෂ්පාදනය සදහා 2013 වර්ෂයේ පුද්ගලික අංශයේ සාමාන්‍ය නිෂ්පාදන වියදම රු. 150.00 කි. එය පෙර වර්ෂයේ නිෂ්පාදන වියදම වු රු. 136.00 හා සසඳා බැලීමේදී, රු 14.00 ක වැඩි වීමක් පෙන්නුම් කරයි. නිෂ්පාදන වියදම 2002 වසරේ සිට වර්ධනය වි ඇති ආකාරය සංඛ්‍යා සටහන් අංක **iv** හි දක්වා ඇත.


**රබර් නිෂ්පාදන වියදම**

*(කි.ග්‍රෑම්1 ක්/රුපියල්)*

| වර්ෂය | වැවිලි සමාගම් | පුද්ගලික අංශය |
|---|---|---|
| 2002 | 55.74 | 54.00 |
| 2003 | 59.76 | 63.30 |
| 2004 | 65.98 | 73.37 |
| 2005 | 72.56 | 77.37 |
| 2006 | 87.65 | 97.20 |
| 2007 | 102.31 | 112.69 |
| 2008 | 119.89 | 114.00 |
| 2009 | 135.83 | 118.56 |
| 2010 | 158.94 | 119.83 |
| 2011 | 188.23 | 129.56 |
| 2012 | 207.00 | 136.00 |
| 2013 | 245.00 | 150.00 |

**සංඛ්‍යා සටහන iv**

**රබර් නිෂ්පාදන වියදම 2002 - 2013**




## 3.3. දේශීය රබර් පරිභෝජනය

මෙරට නිෂ්පාදිත ස්වභාවික රබර් අතීතයේ දි ප්‍රධාන වශයෙන් අපනයනය මත පදනම් වූ වැදගත් කාර්මික අමු ද්‍රව්‍යයක් ලෙස පැවති අතර, වර්තමානය වන විට එම තත්ත්වය ක්‍රමිකව වෙනස් වී දේශිය නිමි භාණ්ඩ නිෂ්පාදනය සඳහා වැඩි වශයෙන් රබර් භාවිතා කිරීමේ නැඹුරුතාවයක් දැක ගත හැකිය. ඒ අනුව 2013 වර්ෂයේදී දේශීය පරිභෝජනය ස්වභාවික රබර් මෙට්‍රික් ටොන් 107259 විය. මෙම ප්‍රමාණය 2013 වර්ෂයේ මුළු රබර් නිෂ්පාදනය වූ මෙට්‍රික් ටොන් 130421 න් 82% කි.

## 3.4. අමු ද්‍රව්‍යයක් ලෙස ස්වාභාවික රබර් අපනයනය


පසුගිය 2012 වසර සමග සන්සඳනය කිරීමේදී 2013 වර්ෂයේ ලංකාවේ රබර් අපනයනයේ කැපී පෙනෙන අඩු වීමක් සිදු වී ඇත.

**2012 සහ 2013 වර්ෂයන්හි ශ්‍රී ලංකාවේ අපනයනය කළ රබර් ප්‍රමාණයන්**

| මාසය | නැව්ගත කළ ප්‍රමාණයන් (මෙට්‍රික් ටොන්) | |
|---|---|---|
| | 2012 වර්ෂය | 2013 වර්ෂය |
| ජනවාරි | 4053 | 2606 |
| පෙබරවාරි | 4940 | 2535 |
| මාර්තු | 5994 | 2373 |
| අප්‍රේල් | 3524 | 1793 |
| මැයි | 2342 | 1247 |
| ජූනි | 1731 | 1225 |
| ජූලි | 1391 | 1213 |
| අගෝස්තු | 1778 | 1799 |
| සැප්තැම්බර් | 2988 | 1912 |
| ඔක්තෝබර් | 2637 | 2082 |
| නොවැම්බර් | 2470 | 1937 |
| දෙසැම්බර් | 3529 | 2864 |
| **එකතුව** | **37377** | **23586** |

**සංඛ්‍යා සටහන V**

**රබර් අපනයනය 2012 - 2013**




2012 සහ 2013 වර්ෂයන්හි ශ්‍රී ලංකාවේ අපනයනය කළ රබර් ප්‍රමාණයන් වර්ග අනුව පහත සටහනේ දක්වා ඇත.

### 2012 සහ 2013 වර්ෂයන්හි අපනයනය කළ රබර් ප්‍රමාණයන් වර්ග අනුව

**(මෙට්‍රික් ටොන්)**

| වර්ෂය | ෂීට් රබර් | සෝල් ක්‍රේප් | ස්ක්‍රැප් ක්‍රේප් | ලේටෙක්ස් ක්‍රේප් | බ්ලොක් රබර් (T.S.R) | ලේටෙක්ස් සහ වෙනත් | **එකතුව** |
|---|---|---|---|---|---|---|---|
| 2012 | 11235 | 1401 | - | 17431 | 4669 | 2641 | **37377** |
| 2013 | 4574 | 2022 | 17 | 13171 | 2397 | 1405 | **23586** |

**සංඛ්‍යා සටහන vi**

මුළු අපනයන රබර් ප්‍රමාණයන්හි නැ.වි.ස (F.O.B) වටිනාකම සටහන **vii** හි දැක්වේ.

### මුළු අපනයන රබර් ප්‍රමාණයන්හි නැ.වි.ස වටිනාකම

**(රුපියල් මිලියන)**

| වර්ෂය | අපනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් | මුළු වටිනාකම රු.මිලියන | කි.ග්‍රෑම් 1ක වටිනාකම රු. ශත |
|---|---|---|---|
| 2012 | 37377 | 15726.00 | 421.00 |
| 2013 | 23586 | 9194.00 | 390.00 |

**සංඛ්‍යා සටහන vii**

රබර් අපනයනය ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශය විසින් කරනු ලබයි. පෞද්ගලික අංශයෙහි ලියාපදිංචි අපනයන කරුවන් 135 දෙනෙකු සිටී. එම අපනයනකරුවන් 135 දෙනාම මෙම දෙපාර්තමේන්තුවේ 2013 වර්ෂය සඳහා ද ලියාපදිංචි කර ඇත.

### රබර් මිලයට ගන්නා ප්‍රධාන රටවල් 2013

**(මෙට්‍රික් ටොන්)**

| රට | මිලයට ගත් ප්‍රමාණය | % |
|---|---|---|
| මැලේසියාව | 4976 | 21 |
| යුරෝපීය සංගමය | 4094 | 17 |
| පාකිස්ථානය | 4652 | 20 |
| ඉන්දියාව | 2600 | 11 |
| ඇමරිකාව | 1008 | 4 |
| හොං කොං | 182 | 1 |
| ජපානය | 1679 | 7 |
| වෙනත් | 4395 | 19 |
| **එකතුව** | **23586** | **100.0** |

**සංඛ්‍යා සටහන viii**

## 3.5. රබර් මිල

ගෝලීය දළ ජාතික නිෂ්පාදනයේ මන්දගාමී වර්ධනය හේතුවෙන් 2011 වසරේ සිට රබර් මිල අඩු වෙමින් පවතින අතර 2012 හා 2013 වර්ෂ වල රබර් මිල පහත පරිදි වේ.


**රබර් වර්ග අනුව සාමාන්‍ය මිල**

*(කිලෝ 1ක් රුපියල්)*

| වර්ෂය | වාර්ෂික සාමාන්‍ය මිල | | |
|---|---|---|---|
| | ෂීට් රබර් නො. 1 | ස්ක්‍රැප් ක්‍රේප් නො.1.XBR | ලේටෙක්ස් ක්‍රේප් නො.1X |
| 2012 | 416.61 | 377.09 | 410.84 |
| 2013 | 376.78 | 309.04 | 397.33 |

**සංඛ්‍යා සටහන ix**

**වාර්ෂික සාමාන්‍ය මිල**



## 3.6. රබර් වෙළඳුන්

රබර් වෙළඳාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම නෛතික අවශ්‍යතාවයක් වන අතර 2013 වර්ෂයේ රබර් වෙළඳුන් 1189 ක් සඳහා බලපත්‍ර නිකුත් කර ඇති දිස්ත්‍රික්ක වශයෙන් එම වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම් මෙසේය.

| දිස්ත්‍රික්කය | අලුත් කළ බලපත්‍ර සංඛ්‍යාව | අලුතින් නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|
| කොළඹ | 54 | 04 |
| ගම්පහ | 35 | 02 |
| කළුතර | 331 | 45 |
| රත්නපුර | 241 | 16 |
| කෑගල්ල | 400 | 23 |
| කුරුණෑගල | 08 | - |
| මහනුවර | 08 | 01 |
| මාතලේ | 03 | - |
| ගාල්ල | 65 | 05 |
| මාතර | 25 | - |
| මොණරාගල | 19 | 10 |
| එකතුව | **1189** | **106** |

**සංඛ්‍යා සටහන x**

## 3.7. රබර් නැවත වගා / අළුත් වගා සහනාධාර ක්‍රමය

සහනාධාර ක්‍රමය යටතේ රබර් නැවත හෝ අළුතෙන් වගා කිරීම සඳහා 1953 අංක 36 දරණ රබර් නැවත වගා කිරීමේ පනතේ 07 වගන්තිය අනුව අවසර පත්‍රයක් ලබාගත යුතුය. මෙම පනත අනුව සියලුම රබර් ඉඩම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතුය. ලියාපදිංචි වූ රබර් ඉඩමක පවතින වගාවේ වයස අවු 20 ඉක්ම වූ පසු එම ඉඩම සහනාධාර ක්‍රමය යටතේ නැවත වගා කිරීම සඳහා බලපත්‍රයක් ලැබීමට සුදුසුකම් ලබයි.

රබර් වගාවේ නිරත වන්නන් තව දුරටත් දිරි ගැන්වීම සඳහා හෙක්ටයාරයකට රු. 125000 ක් වූ නැවත වගා/ අළුත් වගා සහනාධාර මුදල 2011 වසරේදී පහත පරිදි වැඩි කරන ලදී.

අළුත් වගාව සඳහා හෙක්ටයාරයකට රු. 150000

නැවත වගාව සඳහා හෙක්ටයාරයකට රු. 175000

මෙම ආධාර මුදල වාරික 08 කින් ගෙවනු ලැබේ. වාරික ගෙවන ආකාරය පහත සටහනේ දැක්වේ.

| **වාරිකය** | **අලුත් වගාව හෙක්ටයාරයකට (මුදල රුපියල් වලින්)** | **නැවත වගාව හෙක්ටයාරයකට (මුදල රුපියල් වලින්)** |
|---|---|---|
| පළමු වාරිකය (1) | 6,000.00 | 8,000.00 |
| දෙවන වාරිකය (2) | 36,000.00 | 43,000.00 |
| තෙවන වාරිකය (3) | 12,000.00 | 15,000.00 |
| සිව්වන වාරිකය (4) | 18,000.00 | 21,000.00 |
| පස්වන වාරිකය (5) | 18,000.00 | 21,000.00 |
| හයවන වාරිකය (6) | 18,000.00 | 21,000.00 |
| හත්වන වාරිකය (7) | 19,000.00 | 22,000.00 |
| අටවන වාරිකය (8) | 23,000.00 | 24,000.00 |
| **එකතුව** | **150,000.00** | **175,000.00** |

**සංඛ්‍යා සටහන xi**

## 3.8. "මහින්ද චින්තනය" ඉදිරි දැක්ම හා රජයේ මධ්‍යකාලීන ආර්ථික සැලැස්ම ක්‍රියාත්මක කිරීම හා නව වගාවද ඇතුලත්ව රබර් වගා කිරීමේ ප්‍රගතිය

මහින්ද චින්තන වැඩිල්ලට නවෝදයක් වැඩසටහන යටතේ රබර් සංවර්ධනය උදෙසා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් කරන ලද කාර්යභාරය පහත සඳහන් පරිදි වේ. ඒ අනුව මෙරට රබර් කර්මාන්තය ශක්තිමත් ආර්ථික ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යාම සඳහා වයස්ගත වූ, කල් ඉක්මවූ හා ආර්ථික වශයෙන් ඵලදායී නොවන රබර් වගාවන් ඉවත්කොට එම ඉඩම් නැවත වගා කළ යුතු වේ. ඵලදායී වගාවක් පවත්වාගෙන යාම සඳහා මුළු රබර් බිම් ප්‍රමාණයෙන් 3% ක් වත් වාර්ෂිකව නැවත වගා කළ යුතු වේ. එම බිම් ප්‍රමාණය දළ වශයෙන් හෙක්ටයාර් 4000 වේ. 2013 වර්ෂයේ ඇස්තමේන්තු ගත නැවත වගා/ අළුත් වගා රබර් බිම් ප්‍රමාණය හෙක්ටයාර් 10163 විය. 2013 වර්ෂයට නැවත වගා කිරීම සඳහා ඉලක්ක බිම් ප්‍රමාණය කුඩා වතු යටතේ හෙක්ටයාර් 1961 සහ වතු සමාගම් යටතේ හෙක්ටයාර් 1587 ක්ද වශයෙන් හෙක්ටයාර් 3548 කි. වර්ෂය තුල අළුත් වගා ඉලක්කය කුඩා වතු යටතේ සම්ප්‍රදායික ප්‍රදේශ වල හෙක්ටයාර් 2320 සහ සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල හෙක්ටයාර් 4295 ක්ද වශයෙන් හෙක්ටයාර් 6615 කි.

නැවත වගා හා අළුත් වගා සහනාධාර ක්‍රමයන් යටතේ වගා කිරීම සඳහා ලැබුණු ඉල්ලුම් පත්‍ර, නිකුත්කල බලපත්‍ර හා නියම වශයෙන් වගා කරන ලද බිම් ප්‍රමාණයන් සංඛ්‍යා සටහන් xii හා xiii හි සඳහන් වේ.

## රබර් නැවත වගා සහනාධාර ක්‍රමය යටතේ නැවත වගා කළ බිම් ප්‍රමාණය (කුඩා වතු හිමියන්) 2013 වර්ෂය

*(හෙක්ටයාර්)*

| දිස්ත්‍රික්කය | ලද අයදුම් පත්‍ර | | නිකුත් කළ බලපත්‍ර | | නැවත වගාකළ බිම් ප්‍රමාණය | |
|---|---|---|---|---|---|---|
| | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) |
| කළුතර | 1361 | 908.34 | 1282 | 769.78 | 862 | 516.29 |
| කෑගල්ල | 1280 | 780.04 | 1197 | 697.95 | 893 | 531.10 |
| ගම්පහ | 176 | 105.83 | 142 | 100.73 | 128 | 93.74 |
| කුරුණෑගල | 52 | 55.06 | 33 | 45.06 | 25 | 35.32 |
| මහනුවර | 61 | 42.93 | 59 | 35.69 | 54 | 32.19 |
| මාතලේ | 11 | 35.76 | 06 | 22.66 | - | - |
| රත්නපුර | 560 | 404.91 | 504 | 369.83 | 380 | 265.73 |
| ගාල්ල | 103 | 72.83 | 92 | 65.59 | 66 | 62.69 |
| මාතර | 90 | 77.46 | 64 | 66.78 | 40 | 38.37 |
| මොණරාගල | 07 | 12.88 | 07 | 12.88 | - | 10.00 |
| බදුල්ල | 01 | 7.89 | 1 | 7.89 | | |
| කොළඹ | 229 | 164.60 | 220 | 147.82 | 174 | 125.09 |
| **එකතුව** | **3931** | **2668.53** | **3607** | **2342.66** | **2622** | **1710.52** |

**සංඛ්‍යා සටහන xii**

## රබර් අළුත් වගා සහනාධාර ක්‍රමය යටතේ වගා කළ බිම් ප්‍රමාණය
## (කුඩා වතු හිමියන්) 2013

*(හෙක්ටයාර්)*


| දිස්ත්‍රික්කය | ලද අයදුම් පත්‍ර | | නිකුත් කළ බලපත්‍ර | | අළුතින් වගා කළ බිම් ප්‍රමාණය | |
|---|---|---|---|---|---|---|
| | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) |
| කළුතර | 881 | 419.05 | 854 | 385.89 | 585 | 269.09 |
| කෑගල්ල | 1195 | 632.40 | 1176 | 551.56 | 889 | 439.30 |
| ගම්පහ | 230 | 124.19 | 185 | 100.03 | 145 | 86.11 |
| කුරුණෑගල | 205 | 132.60 | 200 | 119.58 | 120 | 79.98 |
| මහනුවර | 104 | 58.08 | 72 | 32.90 | 63 | 26.57 |
| මාතලේ | 36 | 38.00 | 26 | 30.48 | 17 | 14.73 |
| රත්නපුර | 635 | 438.75 | 803 | 525.74 | 503 | 339.88 |
| ගාල්ල | 326 | 199.37 | 295 | 178.95 | 157 | 89.48 |
| මාතර | 348 | 212.43 | 295 | 188.17 | 188 | 127.59 |
| හම්බන්තොට | 149 | 92.16 | 139 | 84.17 | 72 | 38.65 |
| කොළඹ | 143 | 87.21 | 160 | 87.32 | 131 | 72.50 |
| මොණරාගල | 1426 | 876.50 | 1237 | 766.80 | - | 558.00 |
| බදුල්ල | 287 | 362.42 | 232 | 146.39 | - | 129.63 |
| අම්පාර | 487 | 396.12 | 487 | 402.93 | - | 402.93 |
| වවුනියාව | 149 | 116.21 | 142 | 103.25 | 63 | 36.80 |
| මුලතිවු | 9 | 2.83 | 9 | 2.83 | - | - |
| අනුරාධපුරය | 5 | 5.26 | 5 | 5.26 | 3 | 3.60 |
| පොළොන්නරුව | 3 | 3.47 | 3 | 3.47 | 2 | 3.03 |
| **එකතුව** | **6618** | **4197.05** | **6320** | **3715.72** | **2938** | **2717.87** |

**සංඛ්‍යා සටහන xiii**

## රබර් නැවත වගා සහනාධාර ක්‍රමය යටතේ නැවත වගා කළ බිම් ප්‍රමාණය (වතු අංශය) 2013

| ප්‍රාදේශීය කාර්යාලය | වගා කල බිම් ප්‍රමාණය |
|---|---|
| රත්නපුර | 236.40 |
| කළුතර | 71.50 |
| කෑගල්ල | 645.60 |
| ගාල්ල | 18.30 |
| මොණරාගල | 35.20 |
| **එකතුව** | **1007** |

**සංඛ්‍යා සටහන xiv**



## රබර් නැවත වගා බිම් ප්‍රමාණය 1990-2013

(හෙක්ටයාර්)

| වර්ෂය | කුඩා වතු අංශය | වැවිලි සමාගම් | එකතුව |
|---|---|---|---|
| 1990 | 3584 | 1617 | 5201 |
| 1991 | 3507 | 1794 | 5301 |
| 1992 | 2028 | 1889 | 3917 |
| 1993 | 2419 | 2817 | 5236 |
| 1994 | 1623 | 2138 | 3761 |
| 1995 | 1778 | 1461 | 3239 |
| 1996 | 1983 | 1217 | 3200 |
| 1997 | 1172 | 2045 | 3217 |
| 1998 | 1173 | 2542 | 3715 |
| 1999 | 665 | 3866 | 4531 |
| 2000 | 770 | 1853 | 2623 |
| 2001 | 558 | 4584 | 5142 |
| 2002 | 712 | 2066 | 2778 |
| 2003 | 565 | 494 | 1059 |
| 2004 | 819 | 1264 | 2083 |
| 2005 | 1257 | 2329 | 3586 |
| 2006 | 1122 | 2331 | 3453 |
| 2007 | 993 | 4199 | 5192 |
| 2008 | 812 | 5293 | 6105 |
| 2009 | 1002 | 5360 | 6362 |
| 2010 | 1186 | 4755 | 5941 |
| 2011 | 1123 | 1927 | 3050 |
| 2012 | 1117 | 1044 | 2161 |
| 2013 | 1710 | 1007 | 2717 |

**සංඛ්‍යා සටහන XV**

## රබර් නව වගා බිම් ප්‍රමාණය 1990-2013

(හෙක්ටයාර්)

| වර්ෂය | කුඩා වතු අංශය | වැවිලි සමාගම් | එකතුව |
|---|---|---|---|
| 1990 | 1039 | 258 | 1297 |
| 1991 | 1602 | 202 | 1804 |
| 1992 | 612 | 302 | 914 |
| 1993 | 907 | 135 | 1042 |
| 1994 | 670 | 37 | 707 |
| 1995 | 651 | 45 | 696 |
| 1996 | 1208 | 35 | 1243 |
| 1997 | 793 | 21 | 814 |
| 1998 | 516 | 17 | 533 |
| 1999 | 223 | 48 | 271 |
| 2000 | 243 | 34 | 277 |
| 2001 | 150 | 14 | 164 |
| 2002 | 227 | 7 | 234 |
| 2003 | 451 | 7 | 458 |
| 2004 | 518 | 5 | 523 |
| 2005 | 1032 | 11 | 1043 |
| 2006 | 1603 | 297 | 1900 |
| 2007 | 1701 | 333 | 2034 |
| 2008 | 2130 | 414 | 2544 |
| 2009 | 1156 | 275 | 1431 |
| 2010 | 1317 | 96 | 1413 |
| 2011 | 2166 | 838 | 3004 |
| 2012 | 2297 | 179 | 2476 |
| 2013 | 2979 | - | 2979 |

**සංඛ්‍යා සටහන xvi**

## 3.9. කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

මොණරාගල දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 5000 ක් වගා කිරීමේ විශේෂ වැඩසටහනේ වගා කටයුතු මෙම වර්ෂයේ ද ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල, බඩල්කුඹුර, මොණරාගල, මඩුල්ල සහ මැදගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව 2013 වසරේ හෙක්ටයාර් 262 වගා කරන ලදී.

එම හෙක්ටයාර් 5000 වගා කරන ලද ආකාරය පහත වගුවේ දැක්වේ.

| **වර්ෂය** | **වගා කරන ලද බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)** |
|---|---|
| 2008 | 625 |
| 2009 | 838 |
| 2010 | 1540 |
| 2011 | 709 |
| 2012 | 1113 |
| 2013 | 262 |
| **එකතුව** | **5087** |

**සංඛ්‍යා සටහන xvii**

## 3.10. රබර් පැළ තවාන් සහ පැල සැපයීම්

පසුගිය කාලයේ රබර් වගාව කෙරේ වැවිලි කරුවන්ගේ උනන්දුව අධික විය. මේ නිසා රබර් පැල ඉල්ලුම නොකඩවා ඉහළ ගියේය. මේ සඳහා පැළ නිෂ්පාදනයට විශේෂ අවධානයක් දෙපාර්තමේන්තුව විසින් යොමු කෙරිණි. ඒ වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ රබර් පැල තවාන් මෙන්ම පුද්ගලික රබර් පැල තවාන් ආරම්භ කිරීම සිදු කෙරිණි.

පුද්ගලික රබර් පැළ තවාන් හා වාණිජ රබර් පැල තවාන් පිහිටුවීම සඳහා දෙපාර්තමේන්තුවෙන් අවසර පත්‍රයක් ලබා ගත යුතුය. මූලික අවස්ථාවේදී මෙම තවාන් වල උසස් තත්වයේ බද්ධ අතු තවාන් පිහිටුවා ගැනීම සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය දෙපාර්තමේන්තුව සතු තවාන් වලින් සපයනු ලබයි.


### 3.10.1. පුද්ගලික සහ වාණිජ තවාන් බලපත්‍ර 2013

උසස් තත්වයේ බද්ධ රබර් පැල වැවිලිකරුවන්ට ලබාදීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වේ. දෙපාර්තමේන්තු තවාන්වල පැල නිෂ්පාදන ධාරිතාවය වැඩිකිරීම පැලවල ගුණාත්මක බව වැඩි දියුණු කිරීම හා තවාන් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ අරමුණින් තවාන් සංවර්ධන කටයුතු රාශියක් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. පුද්ගලික අංශයේ තවාන් ද උසස් පැල නිෂ්පාදනය සඳහා යොමු කිරීම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයකි. නිර්දේශිත ආකාරයට පිහිටුවා ඇති පැල තවාන් සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි. බලපත්‍ර නිකුත් කල පුද්ගලික පැල තවාන් රබර් පර්යේෂණායතනයේ නිරන්තර අධීක්ෂණයට ලක් වන අතර පැල තවාන් නිර්දේශිත ආකාරයට පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපදෙස් ද ලබාදේ. මෙම පැල තවාන් නිර්දේශිත ආකාරයට පවත්වාගෙන යන්නේ දැයි පසු විපරම් කිරීම රබර් සංවර්ධන නිලධාරීන් විසින් සිදු කරනු ලබයි.

**රජයේ තවාන් වල පැල නිෂ්පාදනය හා පැල නිකුත් කිරීම-2013**

| **තවානේ නම** | **තවාන අයත් වන දිස්ත්‍රික්කය** | **පැල නිෂ්පාදනය** | **පැල බෙදාහැරීම** |
|---|---|---|---|
| කරපිංච | රත්නපුර | 188738 | 126786 |
| මීරිගම | ගම්පහ | 284747 | 221673 |
| වැලිකඩමුල්ල | ගම්පහ | 459372 | 410123 |
| ඇගල්ඔය | කළුතර | 393302 | 331460 |
| කුඹුක්කන | මොණරාගල | 508919 | 364843 |
| ගුරුගොඩ | කළුතර | 286754 | 211933 |
| මිද්දෙණිය | හම්බන්තොට | 109497 | 98875 |
| **එකතුව** | | **2231329** | **1765693** |

**සංඛ්‍යා සටහන xviii**




දෙපාර්තමේන්තු පැල තවාන් වලින් 2013 වසරේදී අපේක්ෂිත පැල නිෂ්පාදනය මිලියන 2.35 කි. වසරේ මුළු පැල නිෂ්පාදනය මිලියන 2.23 වූ අතර වසර තුල බෙදා හැරීමට හැකි වූයේ පැල මිලියන 1.76 ක් පමණි.

**පැල නිෂ්පාදනය ( පුද්ගලික පැල තවාන්) 2013**

| ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශය | ලියාපදිංචි තවාන් ගණන | පැල බෙදාහැරීම |
|---|---|---|
| කෑගල්ල | 59 | 45450 |
| ගම්පහ | 06 | 3835 |
| කළුතර | 02 | 119900 |
| මොණරාගල | 17 | 155088 |
| ගාල්ල | 15 | 9415 |
| මාතර | 10 | 19400 |
| රත්නපුර | 16 | 166330 |
| කොළඹ | 08 | 6500 |
| බදුල්ල | 03 | - |
| **එකතුව** | **136** | **525918** |

**සංඛ්‍යා සටහන xix**

දෙපාර්තමේන්තු පැල තවාන් වලින් මෙන්ම පුද්ගලික අංශයේ තවාන් වලින්ද වැඩි වශයෙන් නිකුත් කලේ RRIC 121 ක්ලෝනය වන අතර පෙර වසරට සාපේක්ෂව RRISL 203 ක්ලෝනය නිෂ්පාදනය වැඩි වී තිබුණි.

## 3.11. අතුරු භෝග වගාව

රබර් සමග අතුරු භෝග වගා කරන කුඩා ඉඩම් හිමියන් සඳහා රබර් පර්යේෂණායතනයේ නිර්දේශ මත අක්කරයකට රු 4000.00 බැගින් සහනාධාර ගෙවීම මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. මේ අනුව 2013 වර්ෂයේ දී අතුරු භෝග සහනාධාර වශයෙන් රු.මි. 1.08 ක මුදලක් ගෙවන ලදී.




රබර් සමග අතුරුභෝග

**2013 වර්ෂයේ අතුරුබෝග වගාකල බිම් ප්‍රමාණය**

| දිස්ත්‍රික්කය | වගාකල බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) |
|---|---|
| කෑගල්ල | 93.09 |
| ගම්පහ | 78.99 |
| කුරුණෑගල | 37.68 |
| මහනුවර | 4.63 |
| කළුතර | 57.55 |
| රත්නපුර | 31.12 |
| කොළඹ | 33.76 |
| ගාල්ල | 6.72 |
| මාතර | 15.78 |
| හම්බන්තොට | 13.57 |
| **එකතුව** | **372.89** |

**සංඛ්‍යා සටහන xx**




### 3.12. වැහි ආවරණ භාවිතය ප්‍රචලිත කිරීම

පරිනත රබර් වගා ඉඩම් වල ඵලදායීතාවය ඉහල නැංවීම සඳහා රබර් වගාකරුවන් වැහි ආවරණ භාවිතයට උනන්දු කිරීම උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. සාර්ථක වැහි ආවරණ යොදා ඇති ගසකට ඒ සඳහා වැයවන මුදලින් 50% එනම් රු. 30 ක මුදලක් සහනාධාර වශයෙන් ගෙවනු ලබයි.

කුඩා වතු හා වැවිලි සමාගම් සඳහා මේ යටතේ සහනාධාර ගෙවීම් කරන ලදි. මෙම වැඩසටහනේ ප්‍රගතිය පහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**වැහි ආවරණ යෙදීම**

| අංශය | වැහි ආවරණ යෙදූ බිම් ප්‍රමාණය (හෙක්.) | සහනාධාර වශයෙන් ගෙවූ මුදල රු. මි. |
|---|---|---|
| කුඩා වතු | 517.01 | 7.73 |
| වැවිලි සමාගම් | 2708.21 | 47.95 |
| එකතුව | 3225.22 | 55.68 |

**සංඛ්‍යා සටහන xxi**

### 3.13. තේ, රබර් සහ පොල් ඉඩම් කැබලි කිරීම පාලනය කිරීමේ මණ්ඩලයේ කටයුතු

1958 අංක 02 දරණ තේ හා රබර් වතු (කැබලි කිරීම පාලනය කිරීමේ) පණත යටතේ ඉඩම් කැබලි කිරීම පාලනය කිරීමේ මණ්ඩලයක් පිහිටුවනු ලැබ ඇත. හෙක්ටයාර 20 ට වැඩි රබර් වත්තක් හෝ ඉන් කොටසක් කැබලි කැඩීමට හෝ විකිණීමට අවශ්‍ය වූ විට එම මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු වේ. මෙහිදී එම ආයතනයෙන් ලැබුනු අයදුම්පත්‍ර සඳහා මැනවින් සුපරීක්ෂණය කර ඉහත කී මණ්ඩලය වෙත නිර්දේශ යවනු ලැබීයි වර්ෂය තුල යවන ලද නිර්දේශ ගණන පහකට සීමා විය.

මෙම මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ගරු අමාත්‍යවරයා විසින් කරන ලද පත්වීම ප්‍රකාර පැවරුන රාජකාරි ඉටු කරන ලදී.

### 3.14. අන්තර් ජාතික කටයුතු

ශ්‍රී ලංකාව **ජාත්‍යන්තර රබර් අධ්‍යයන කණ්ඩායමේ (IRSG)** හා **ස්වභාවික රබර් නිපදවන රටවල සංගමයේ (ANRPC)** සාමාජිකත්වය දරයි ඒ සඳහා 2013 වර්ෂයේ සාමාජික මුදල වශයෙන් ස්වභාවික රබර් නිපදවන රටවල සංගමයට රු. 974727 ක් ද ජාත්‍යන්තර රබර් අධ්‍යයන කණ්ඩායමට රු. 5304229.38 ක් ද ගෙවා ඇත.

මෙම ආයතනවල සාමාජිකත්වය දැරීමෙන් එකී ආයතනවල ක්‍රියාකාරකම් වලට ඍජුව හා ක්‍රියාශීලීව දායක වීම තුලින් අන්‍යෝන්‍ය වශයෙන් රබර් කර්මාන්තයේ උන්නතියට වාසි සහගතතාවයක් උදා කෙරිණි. තවද එකී ආයතනවලට දේශීය රබර් මිල, නිෂ්පාදන හා අලෙවි තොරතුරු, වගා බිම් ප්‍රමාණ, ක්ෂේත්‍රයේ නියැලි සංඛ්‍යාවන් ඇතුළු අවශ්‍ය සියළු තොරතුරු කලට වේලාවට වර්ෂය පුරාම වාර්තා කරන ලදී. එසේම එම ආයතන මගින් සෙසු රටවල තොරතුරුද ලබා ගෙන අදාල පාර්ශවයන් අතර බෙදාහරින ලදී.

ස්වභාවික රබර් නිපදවන රටවල සංගමයේ (ANRPC) වාර්ෂික සමුළුව 2013.10.08 සිට 2013.10.12 දක්වා ශ්‍රී ලංකාවේදී පැවැත්විණි. ඒ සඳහා ශ්‍රී ලංකාව, ඉන්දියාව, කාම්බෝජය, තායිලන්තය, වියට්නාමය, පැපුවානිව් ගිනියාව, ඉන්දුනීසියාව, මලයාසියාව, චීනය යන සාමාජික රටවල් සහභාගි විය.

මෙම සමුළුවෙහි සංවිධාන කටයුතු ඉතා සාර්ථකව ඉටු කිරීමට හැකි වූ අතර ඒ සඳහා ස්වභාවික රබර් නිපදවන රටවල සංගමයේ (ANRPC) අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු සහභාගි වූ සියලු රටවල සාමාජිකයන්ගේ ප්‍රශංසාව ද හිමි විය.

මෙම සමුළුවේදී ඉදිරි වසර සඳහා සභාපතිත්වය ශ්‍රී ලංකාවට හිමි වූ අතර එහිදී සභාපති ලෙස වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් තුමිය පත් කර ගන්නා ලදී.

## 3.15. නෛතික කටයුතු

රබර් නැවත වගා කිරීම පිණිස සහනාධාර පනත යටතේ රබර් වගා අවසර පත්‍රයක් මත ආධාර ලබාගත් සෑම ඉල්ලුම්කරුවෙක්ම සියළුම ආධාර මුදල් ලබාගෙන නිම කරන තුරු වගාව හොඳින් පවත්වා ගෙන යෑමට සහ අවශ්‍ය වැඩ කටයුතු කිරීමට සහනාධාර නියෝග අනුව බැඳී සිටී. අවසර පත්‍ර දරන්නන් ඔවුන්ගේ වගාව නොසලකා හරින්නේ නම් සහ අවසන් ආධාර වාරිකය ලබාගන්නා තෙක් වගාව හොඳින් පවත්වාගන නොයන්නේ නම් ලබාගෙන ඇති ආධාර මුදල් දෙපාර්තමේන්තුවට ආපසු ගෙවීමට නියෝග කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අදාල පනත අනුව ගැසට් පත්‍රයේ පල කරන ලද නියෝගවල විධි විධාන පරිදි ආධාර ලබන ඉඩමක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අවසර රහිතව අන්සතු කළ නොහැක.

මේ අනුව අවසර පත්‍රයේ වලංගු කාල සීමාව දීර්ඝ කර අවසර පත්‍ර දරන්නන්ට වගාව සම්පූර්ණ කිරීමට තරම් අවශ්‍ය කල් ලබාදී රබර් නැවත වගා සහනාධාර පනතේ පරමාර්ථ ඉටු නොවන අයුරින්, සාර්ථකව රබර් වගාවක් පවත්වාගන යාමට අපොහොසත් වන (සහනාධාර ලබාගත්) ඉඩම් හිමියන්ට, ලබාගත් ආධාර ආපසු ගෙවීමට දන්වනු ලැබේ. එසේ නොගෙවන ඉඩම් හිමියන්ට අවසන් පියවරක් වශයෙන් නඩු පවරනු ලැබේ.

**අසාර්ථක වගා අය කිරීම් - 2013 වර්ෂය**

| දිස්ත්‍රික්කය | අයකරගත් වගාකරුවන් සංඛ්‍යාව | අවසන් නිවේදන යවා අය කර ගත් මුදල :රු.* | නඩු පවරා අය කර ගත් මුදල :රු.* |
|---|---|---|---|
| ගාල්ල | | | |
| මාතර | 120 | 669679.49 | |
| හම්බන්තොට | | | |
| කෑගල්ල | 77 | 652389.67 | 44837.93 |
| මොණරාගල | - | - | - |
| කොළඹ | 08 | 55034.86 | - |
| රත්නපුර | 26 | 130450.93 | - |
| කළුතර | 71 | 320803.00 | - |
| **එකතුව** | **302** | **1828357.95** | **44837.93** |

**සංඛ්‍යා සටහන xxii**

තවද දේශගුණික හා වෙනත් සාධාරණ හේතු මත වගාවන් අසාර්ථක වූ ගොවීන් සම්බන්ධයෙන් පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කරමින් උපදේශක මණ්ඩලයේ අනුමැතිය ලබා සහනාධාර මුදල් කපා හැරීමට ක්‍රියාකරන ලදී.

## 3.16. සහනාධාර ගෙවීම්

සමාලෝචනයට භාජනය වන 2013 වසර තුල පහත දැක්වෙන පරිදි ඒ ඒ වගාවන් සඳහා සහනාධාර මුදල් ගෙවීමට දෙපාර්තමේන්තුව සමත් විය.

**රබර් වගාව සඳහා සහනාධාර ගෙවීම්**

| ව්‍යාපෘතිය | ගෙවූ මුදල් එකතුව ( රු.මි. ) |
|---|---|
| 2013 නැවත වගා සහනාධාර (පෞද්ගලික අංශය) | 171.31 |
| 2013 අළුත් වගා සහනාධාර(පෞද්ගලික) | 167.73 |
| 2013 නැවත වගා සහනාධාර (වැවිලි සමාගම්) | 97.45 |
| **එකතුව** | **436.49** |

**සංඛ්‍යා සටහන xxiii**

## 3.17. විශේෂ සංවර්ධන වැඩසටහන්

### 3.17.1. අම්පාර දිස්ත්‍රික්කයේ රබර් වගාව ව්‍යාප්ත කිරීම

2012 අයවැය යෝජනා අනුව අම්පාර දිස්ත්‍රික්කයේ රබර් වගාව ව්‍යාප්ත කිරීමට ගත් තීරණය අනුව හෙක්ටයාර 10,000 ප්‍රමාණයක රබර් වගා කිරීමට ඉලක්ක කොට ඇත. ඒ අනුව 2015 වර්ෂය වන විට එම ඉලක්කය සපුරා ගැනීමට අපේක්ෂිත වන අයුරින් රබර් වගා වැඩසටහන් මෙම වර්ෂයේදී සැලසුම් කරන ලදී. මෙහි මූලික පියවර වශයෙන් 2012 වසරේදී හෙක් 550 ක රබර් වගා ඉලක්කයක් පැවති අතර වසර අවසාන වන විටදී හෙක් 137.5 ක රබර් වගා කරන ලදී. මහඔය, පදියතලාව, උහන යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 3 වම බෙදී යන ආකාරයට රබර් වගා වැඩසටහන ව්‍යාප්ත වී පවතී.

එහි දෙවන පියවර වශයෙන් 2013 වසරේදී හෙක් 402.93 වගා කරන ලදී.

### 3.17.2. උතුරු පලාතේ රබර් වගාව ව්‍යාප්ත කිරීම

උතුරු පලාතේ රබර් වගාව ව්‍යාප්ත කිරීමේ වැඩසටහන යටතේ හෙක්ටයාර් 3200 ක රබර් වගා වැඩසටහනක් වවුනියාව හා මුලතිවු දිස්ත්‍රික්ක වල ව්‍යාප්ත කිරීම සඳහා පියවර ගෙන ඇත. ඒ අනුව එම පලාතේ ජනතාවට සාර්ථක සේවයක් සැලසීම සඳහා වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ මෙම දෙපාර්තමේන්තුවේ කාර්යාලයක් ගරු වැවිලි කර්මාන්ත ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරන ලදී.

මේ වන විට වවුනියාව දිස්ත්‍රික්කයේ හෙක් 103.25 සඳහා බලපත්‍ර නිකුත් කර ඇති අතර හෙක් 36.8 ක රබර් අළුතින් වගා කර ඇත.

මුලතිවු දිස්ත්‍රික්කය සඳහා හෙක් 2.83 සඳහා බලපත්‍ර නිකුත් කර ඇත.

### 3.17.3. දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන 2013

අඩු ආදායම්ලාභී පවුල් වල ජීවනෝපාය සංවර්ධනය කරගනිමින්, ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමට අවශ්‍ය මූලික යටිතල පහසුකම් පුළුල් කිරීමත්, ඔවුන්ගේ අධ්‍යාපන, සෞඛ්‍ය ආදී සමාජ සංවර්ධනයට අවශ්‍ය පරිසරය සකස් කිරීමත්, ග්‍රාමීය ජනතාවගේ වෙළඳපොල අවශ්‍යතා හා ජාතික ආර්ථික ප්‍රතිලාභ උපරිම ලෙස ලබා ගැනීමට හැකිවන පරිදි යටිතල පහසුකම් සම්බන්ධ කිරීමත්, ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ කාර්යභාරය වී ඇත.

ඒ අනුව, ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ මූලය අනුග්‍රහය ඇතිව ක්‍රියාත්මක කරන දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන රබර් අංශය තුලද 2013 වර්ෂයේදීද ක්‍රියාවට නංවන ලදී. මේ යටතේ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පාළු සිටුවීම සඳහා රබර් පැල නොමිලේ සැපයීම, අපරිනත රබර් වගා බිම් වල අතුරු භෝග ලෙස කෙසෙල්, අන්නාසි, පැෂන් වගා කිරීම සඳහා නොමිලේ පැල සැපයීම, අස්වනු සහායක පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූවන් හට 50% සහනාධාර මත කිරි පිහි ලබාදීම හා දෙපාර්තමේන්තුව සතු රබර් පැල තවාන්වල සංවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ආධාර සැපයීම යන වැඩසටහන් මෙම වසරේදී ක්‍රියාත්මක කරන ලදී. පාළු සිටුවීම සඳහා රබර් පැල බෙදා දීම මෙම වර්ෂයේදී සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වන මොණරාගල, අම්පාර, හම්බන්තොට, වව්නියාව, බදුල්ල යන දිස්ත්‍රික්කයන් ඇතුළුව රබර් වගා කරන සියලුම දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කල අතර අතුරු භෝග වගා වැඩසටහන සහ කිරි පිහි බෙදා දීමේ වැඩසටහන රබර් වගා කරන සියළුම ප්‍රදේශ අවරණය වන පරිදි ක්‍රියාත්මක කරන ලදී. දෙපාර්තමේන්තුව සතු රබර් පැල තවාන් 7 ක් දිස්ත්‍රික්ක 5 ක පවතින අතර ඒවායෙහි සංවර්ධන කටයුතු සඳහා මෙම වර්ෂයේදී ආධාර මුදලක් ලබා දෙන ලදී. මෙය දිවිනැගුම වැඩසටහන යටතේ ප්‍රථම වතාවට මෙම වසරේදී සිදු කරන ලදී. දැනට මෙහි ප්‍රතිඵලයක් ලෙස උසස් තත්ත්වයෙන් යුත් රබර් පැල නිෂ්පාදනය කර බෙදාහැරීමට අවශ්‍ය කටයුතු සලසා ගැනීමට හැකි වීම මෙම වැඩසටහනෙන් ලද පිටුවහලකි. දිවි නැගුම වැඩසටහන යටතේ මෙම වර්ෂයේදී රුපියල් මිලියන 11 මුදලක් මෙම දෙපාර්තමේන්තුවට වෙන්කර දී තිබූ අතර එහි ප්‍රගතිය පහත වගුවේ දැක්වේ.

# දිවිනැගුම වැඩසටහනේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| වැඩසටහන | මූල්‍ය ප්‍රගතිය | | | භෞතික ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | වෙන් කල මුදල රු.මි. | වියදම රු.මි. | % | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | % |
| පාළු සිටුවීම සඳහා රබර් පැල සැපයීම (පැල) | 6.00 | 4.84 | 81 | 100,000 | 80,713 | 81 |
| අතුරු භෝග වගාව (පැල) | 2.00 | 1.75 | 88 | 96,389 | 88,670 | 92 |
| කිරි පිහි සැපයීම (පිහි ගණන) | 0.91 | 0.81 | 89 | 3,020 | 2,799 | 93 |
| රජයේ තවාන් සංවර්ධන කටයුතු කිරීම | 2.09 | 2.82 | 135 | | | |
| 2013 එකතුව | 11.00 | 10.22 | 93 | - | - | - |
| 2012 පාළු සිටුවීම සඳහා පැල සැපයීම | | 0.77 | | | | |
| මුළු එකතුව | 11.00 | 10.99 | 100 | | | |

**සංඛ්‍යාන සටහන xxiv**



දිවිනැගුමෙන් සවිබල ගන්වන ලද කම්හලක්



රබර් බුෂ් නිෂ්පාදන එකතුවක්

## 3.18. ඒකාබද්ධ අරමුදල

| **වියදම් විෂය** | **මුළු ප්‍රතිපාදන ලැබීම් රු. මි.** | **ශුද්ධ වියදම් රු. මි.** |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | |
| පුද්ගල පඩි නඩි | 149.30 | 148.18 |
| ගමන් වියදම් | 9.60 | 9.55 |
| සැපයීම් | 7.40 | 7.23 |
| නඩත්තු වියදම් | 5.48 | 5.31 |
| සේවා | 15.32 | 15.09 |
| සංවර්ධන සහනාධාර | 550.00 | 543.38 |
| මාරු කිරීම් (සම්මාදම් දායක මුදල්,දේපළ ණය පොළී) | 16.75 | 12.31 |
| **එකතුව** | **753.85** | **741.05** |
| **ප්‍රාග්ධන වියදම්** | | |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් | 17.50 | 14.15 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 4.20 | 1.30 |
| හැකියා වර්ධනය | 1.00 | 0.94 |
| වෙනත් මූලධන ආයෝජන (2502) | 73.30 | 43.66 |
| **එකතුව** | **96.00** | **60.05** |
| **මුළු එකතුව** | **849.85** | **801.10** |

**සංඛ්‍යා සටහන XXV**

## 3.19. සෙස් බදු පිළිබඳ කටයුතු

(1) ලියාපදිංචිය

| | |
|---|---|
| ලියාපදිංචි ආයතන ගණන | 144 |
| ගෙවිය යුතු මුළු සමාගම් ගණන | 54 |
| සෙස් ගෙවන සමාගම් ගණන | 48 |

**සංඛ්‍යා සටහන xxvi**

**දේශීය පරිභෝජනය අනුව අය කළ සෙස් බද්ද**

| **අදාල මාසය** | **ආදායම (දේශීය පරිභෝජනය අනුව) රු.** |
|---|---|
| ජනවාරි | 29515233.83 |
| පෙබරවාරි | 24569435.17 |
| මාර්තු | 25525488.30 |
| අප්‍රේල් | 15692108.95 |
| මැයි | 36769749.51 |
| ජුනි | 14324022.94 |
| ජුලි | 9420759.37 |
| අගෝස්තු | 18451376.89 |
| සැප්තැම්බර් | 19947862.08 |
| ඔක්තෝම්බර් | 19151612.94 |
| නොවැම්බර් | 17332740.24 |
| දෙසැම්බර් | 34673115.53 |
| **එකතුව** | **265373505.75** |

**සෙස් බදු සංඛ්‍යා සටහන -xxvii**

රබර් ආනයනය හා අපනයනය මත අය කරන ලද සෙස් බදු මුදල් පිළිබඳ විස්තර මෙසේය.

**ආනයන හා අපනයන මත අය කළ සෙස් බද්ද - 2013**

| අදාල මාසය | ආනයනය මත<br>රු. | අපනයනය මත<br>රු. |
|---|---|---|
| ජනවාරි | 6111377.00 | 2116020.00 |
| පෙබරවාරි | 3525902.00 | 4191843.00 |
| මාර්තු | 4804338.00 | 4338920.00 |
| අප්‍රේල් | 3068400.00 | 2509232.00 |
| මැයි | 5147432.00 | 5845491.00 |
| ජූනි | 796834.00 | 4179090.00 |
| ජූලි | 128430.00 | 4581200.00 |
| අගෝස්තු | - | 4639824.00 |
| සැප්තැම්බර් | - | 4376800.00 |
| ඔක්තෝම්බර් | - | 4660844.00 |
| නොවැම්බර් | - | 4864163.00 |
| දෙසැම්බර් | - | 4025762.00 |
| **එකතුව** | **23582713.00** | **50329189.00** |

**සෙස් බදු සංඛ්‍යා සටහන xxviii**

## 3.20. නැවත වගා කිරීමේ උපදේශක මණ්ඩලය

1953 අංක 36 දරණ රබර් නැවත වගා සහනාධාර පනතේ 10 වන වගන්තිය සහ 1956 අංක 11 දරණ රබර් පාලන පනතේ 40 හා 41 යන වගන්ති වලට අනුකූලව මෙම මණ්ඩලය ස්ථාපනය කොට ඇත.

මෙම මණ්ඩලය රබර් නැවත වගා සහනාධාර පනත සම්බන්ධව පැන නැගෙන කරුණු පිළිබඳ ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමන්ට උපදෙස් ලබාදීම සහ රබර් නැවත වගා කිරීමේ සහනාධාර ක්‍රමය පරිපාලනය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් වරයාට උපදෙස් ලබාදීම සිදු කරනු ලබයි.

මෙහි සභාපති නිළ බලයෙන් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වේ. ඉතිරි සාමාජිකයින් ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් පත් කරනු ලබයි.


## 3.21. අභ්‍යන්තර විගණන කටයුතු

- ප්‍රධාන කාර්යාලයේ නිවාඩු පරීක්ෂා කිරීම
- 2011 වර්ෂය තුල පැළ බෙදාහැරීම පරීක්ෂාකිරීම -මොනරාගල ප්‍රාදේශීය කාර්යාලය
- 2011 වර්ෂය තුල පැළ බෙදාහැරීම සහ පැළ අයකිරීම සඳහා පරිගණකගත කිරීම පරීක්ෂාකිරීම - මොනරාගල ප්‍රාදේශීය කාර්යාලය
- අභ්‍යන්තර විගණන මූලික හා පළමු කාර්තු වාර්තාව
- ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම (2012 දෙවන කාර්තුව) කොළඹ ප්‍රධාන කාර්යාලය
- ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම (2012 තෙවන කාර්තුව) කොළඹ ප්‍රධාන කාර්යාලය
- තවාන් කාරක ගිණුම පරීක්ෂා කිරීම - මීරිගම තවාන -2012
- තවාන් කාරක ගිණුම පරීක්ෂා කිරීම - වැලිකඩමුල්ල තවාන -2012
- පැල ප්‍රවාහන ලොරි රථ ධාවන සටහන් පරික්ෂා කිරීම - 2012
- අභ්‍යන්තර විගණන දෙවන කාර්තු වාර්තාව - 2013
- ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම (2012 සිව්වන කාර්තුව කොළඹ ප්‍රධාන කාර්යාලය)
- තවාන් කාරක ගිණුම පරීක්ෂා කිරීම 2012 ගුරුගොඩ තවාන
- තවාන් කාරක ගිණුම පරීක්ෂා කිරීම 2012 ඇගල්ඔය තවාන
- 2012 ක්‍රියාත්මක සැලැස්ම අනුව රජයේ තවාන් වල පැළ නිෂ්පාදන ප්‍රගතිය පරීක්ෂා කිරීම
- අභ්‍යන්තර විගණන තෙවන කාර්තු වාර්තාව - 2013
- 2012 වසරේ වාර්ෂික වගා ඉලක්ක සඳහා දෙපාර්තමේන්තුව මඟින් පැළ සැපයිමට අපොහොසත් වීම
- මොණරාගල ප්‍රාදේශීය කාර්යාලය - අභ්‍යන්තර විගණනය


# 4. ප්‍රාදේශීය කාර්යාල ප්‍රගතිය

දිවයිනේ රබර් වගා කරන දිස්ත්‍රික්ක 14 ක සේවා සැපයීම සඳහා ප්‍රාදේශීය කාර්යාල 5 ක් පිහිටුවා ඇති අතර 2018 වසරේදී එම කාර්යාල අත් කරගත් ප්‍රගතිය පහත පරිදි වේ.


## 4.1. රබර් නව වගා ප්‍රගතිය





## 4.2. රබර් නැවත වගා ප්‍රගතිය




## 4.3. අතුරුභෝග වගා ප්‍රගතිය





## 4.4. වැහි ආවරණ යෙදීම




## 4.5. කිරි කැපුම් ශිල්පී පුහුණු වැඩසටහන




## 4.6. කිරි කැපුම් ශිල්පී වෘත්තීය පුහුණු වැඩසටහන



## 4.7. බද්ධකරුවන් පුහුණු වැඩසටහන








ප්‍රාදේශීය කාර්යාල මගින් පුහුණු වැඩසටහන් පැවැත්වීම

## 5. අනෙකුත් ආයතනවල සේවාවන් ඉටුකිරීම.

ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් කරන ලද පත්කිරීම් ප්‍රකාර වර්ෂය තුල පහත සඳහන් ආයතන වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය දරමින් පැවරුන රාජකාරි ඉටු කරන ලදී.

1) ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය
2) තුරුසවිය අරමුදල
3) ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව
4) වතු ඉඩම් කැබලි කිරීම පාලනය කිරීමේ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර වලට සහභාගි වීම, අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම, තීරණ සඳහා සහාය දීම, අවශ්‍ය එකඟතා සහ අනුමැතීන් පළ කිරීම, කටයුතු විමර්ශනය කිරීම, එකී ආයතනවල ක්‍රියාත්මක වැඩ සටහන් සඳහා දායකත්වය සැපයීම යන කටයුතු මෙහිදී ඉටු කරන ලදී.

මීට අතිරේකව දෙපාර්තමේන්තුවේ සේවාවන් අවශ්‍යකළ සියළුම අමාත්‍යාංශ දෙපාර්මේන්තු, අනකුත් රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන පුද්ගලයන්ට ඔවුන් ඉල්ලා සිටි සේවාවන් තොරතුරු හා සහායන් නොඅඩුව ලබාදුනි. පාසැල් ප්‍රදර්ශන සහාය දේශන හා තොරතුරු සහාය. ආයතනවලට හා පුද්ගලයන්ට අවශ්‍ය සංඛ්‍යාත්මක තොරතුරු හා පැහැදිලි කිරීම්, ශිල්පීය උපදෙස් ආදිය ලබාදීම මේ අතර විය.

මේ සේවාවන් හා තොරතුරු ලබාදීම ප්‍රධාන කාර්යාලයේ ප්‍රදේශීය කාර්යාලවල හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේද තවාන් කළමණාකරුවන්ගේද සහයෙන් සිදුවිය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඒඑෆ් 2/ජේ/ආර්සීඑෆ්/1/13/එෆ්ජී

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2014 අගෝස්තු 27 දින

අධ්‍යක්ෂ ජනරාල්
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

රබර් පාලන අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

---

රබර් පාලන අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1957 අංක 45 දරන රබර් පාලන (සංශෝධිත) පනත මඟින් සංශෝධිත 1956 අංක 11 දරන රබර් පාලන පනතේ (436 අධිකාරය) 39 (අ) (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. .මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් , වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර මතය සඳහා පදනම

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේනම් අනුගාමී මූල්‍ය ප්‍රකාගනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට රබර් පාලන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භෞතිකව නොපවත්නා රු.985,925 ක්වූ වත්කම් අයිතම 07 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර, මින් වටිනාකම රු.84,350 ක්වූ ලිබඩු, කාර්යාල උපකරණ, විදුලි උපකරණ හා සුභ සාධන සංගම් උපකරණ යන අයිතම සඳහා වාර්ෂිකව ක්ෂය ප්‍රතිපාදනද වෙන්කර තිබුණි.

(ආ) ස්ථාවර තැන්පතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු රු.805,000 ක්වූ පොළිය ගිණුම්ගත කිරීමෙන් තොරව මහා භාණ්ඩාගාරයේ රැස්කිරීමේ ගිණුමකට බැරකර තිබුණි.

(ඇ) විගණන ගාස්තු වෙනුවෙන් කරන ලද පූර්ව ගෙවීම් නොසලකා ප්‍රතිපාදන සිදුකිරීම නිසා රු.120,000 ක අධි ප්‍රතිපාදනයක් සිදුකර තිබුණි.

(ඈ) ඒකාබද්ධ අරමුදලට බැරකර තිබූ රු.1,864,559 ක් රබර් පාලන අරමුදලෙන් අඩුකර දක්වනවා වෙනුවට එය ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් සනාථ කර ගැනීම සඳහා කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම |
|---|---|---|
| | | රු. |
| (අ) | ස්ථාවර වත්කම් | 985,925 |
| (ආ) | ජංගම වත්කම් | 635,272 |
| (ඇ) | ජංගම බැරකම් | 239,784 |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.497,051 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රු.463,652 ක අතිරික්තයක් වූයෙන් පසුගිය වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.33,399 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

### 3.2 කාර්යය සාධනය

#### 3.2.1 අරමුදලේ ක්‍රියාකාරකම් පිළිබඳ වර්තමාන තත්ත්වය

ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින මෙම අරමුදල ඇවර කිරීම පිණිස අදාල පනතේ විධි විධාන අනුව හා 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කළ විගණිත ගිණුම්හි දැක්වෙන වත්කම් හා වගකීම් නිරවුල් කර අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් අරමුදල ඇවර කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු බව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අමතන ලද 2011 ඔක්තෝබර් 21 දිනැති PF/Fd/04/46 දරන ලිපියෙන් දැනුම් දී තිබුණි. කෙසේ වුවද 2014 ජුනි 23 දින දක්වාම ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4. පද්ධති හා පාලනයන්

---------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඒඑෆ් 2/ජේ/ආර්ආර්එස්එෆ්/1/13/එජ්    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2014 අගෝස්තු 27 දින

අධ්‍යක්ෂ ජනරාල්
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

**රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.**

---

රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1953 අංක 36 දරන රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදල් පනතේ (437 අධිකාරිය) 6 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34    +94-11-2887223    oaggov@sltnet.lk    www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000 - 1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් , වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේනම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රබර් නැවත වගා කිරීමේ අරමුදලට අයත් රු.63,438,233 ක් පිරිවැය වූ ස්ථාවර වත්කම් භෞතිකව හඳුනාගෙන නොතිබූ අතර මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා නොකරන මෙම වත්කම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.827,880 ක් ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි.

(ආ) ගණනය කිරීමේ දෝෂ හා රඳවා ගැනීමේ බදු අඩු කිරීම් සැලකිල්ලට නොගැනීම හේතුවෙන් ස්ථාවර තැන්පතු පොළී ආදායම ලෙස රු.110,849 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) විගණන ගාස්තු වෙනුවෙන් කරන ලද පූර්ව ගෙවීම් නොසලකා ප්‍රතිපාදන සිදුකිරීම නිසා රු.1,061,126 ක අධි ප්‍රතිපාදනයක් සිදුකර තිබුණි.

(ඈ) ඒකාබද්ධ අරමුදලට බැරකර තිබූ රු.70,659,527 ක් රබර් නැවත වගාකිරීමේ අරමුදලෙන් අඩුකර දක්වනවා වෙනුවට එය ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි.

## 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් සනාථ කර ගැනීම සඳහා කිසිඳු සාක්ෂියක් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

| විෂයය | වටිනාකම |
|---|---|
| | රු. |
| ස්ථාවර වත්කම් | 63,438,233 |
| ජංගම වත්කම් | 157,595,843 |
| ජංගම වගකීම් | 18,868,118 |
| අයකරගත යුතු අත්තිකාරම් | 15,220,514 |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.84,522 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ රු.383,580 ක ඌනතාවයක් වූයෙන් පසුගිය වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.468,102 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

**3.2 කාර්යය සාධනය**

**3.2.1 අරමුදලේ පැවැත්ම**

ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින මෙම අරමුදල ඈවර කිරීම පිණිස අදාල පනතේ විධි විධාන අනුව හා 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කළ විගණිත ගිණුම්හි දැක්වෙන වත්කම් හා වගකීම් නිරවුල් කර අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් අරමුදල ඈවර කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු බව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අමතන ලද 2011 ඔක්තෝබර් 21 දිනැති PF/Fd/04/47 දරන ලිපියෙන් දැනුම් දී තිබුණි. කෙසේ වුවද 2014 ජුනි 23 දින දක්වාම ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**4. පද්ධති හා පාලනයන්**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) අත්තිකාරම් පියවීම

(ඇ) ණයගැති / ණයහිමි පාලනය

(ඈ) ස්ථාවර වත්කම් පාලනය

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති